## නිෂ්පාදන වියදම

- වට්ටක්කා යොදා ලීටරයකින් මිලි ලීටර 80 ක් වන අයිස්ක්‍රීම් 30 ක් පමණ නිෂ්පාදනය කළ හැකිය.
- වට්ටක්කා කිලෝව රු.80.00 ට මිලදී ගෙන අයිස්ක්‍රීම් සෑදීමේ දී එකක් සඳහා රු. 23.00 ක පමණ නිෂ්පාදන වියදමක් දැරීමට සිදුවේ.


**තාක්ෂණ දායකත්වය**

එස්.එම්.ඒ.සී.යූ. සේනාරත්න
(සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ - පර්යේෂණ)
කේ.ඩබ්.පී.ඩී. කරඳවල (සංවර්ධන නිළධාරි)
ඩී.කේ. විජේරත්න (පර්යේෂණ සහකාර)
එච්.එම්.එන්.ඩී.බී.හෙන්නායක (පර්යේෂණ සහකාර)
ඒ.එම්.එම්.එල්. අබේකෝන් (සංවර්ධන නිළධාරි)
කේ.බී.ජී.ඒ. තරංගනී (පර්යේෂණ උප සහකාර)
පී.ජී.ඒ.එස්. කරුණාතිලක (යන්ත්‍ර ක්‍රියාකරු)

**තාක්ෂණික සහය**

ආර්.ජී.වී. රාජපක්ෂ
කල්‍යාණි හේරත්

ආහාර පර්යේෂණ ඒකකය, ගන්නෝරුව
දු.ක: 0812 388246 ෆැක්ස්: 0812 387398
ඊ මේල්: fru100@gmail.com



**සැකසුම**

ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය,
ගන්නොරුව

**මුද්‍රණය**

කෘෂිකර්ම ප්‍රකාශන ඒකකය,
ගන්නොරුව


PUMPKIN ICE CREAM

# වට්ටක්කා අයිස්ක්‍රීම්




කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි - 2020

ඉතා තද කහ පැහැති මාංසලයකින් යුත් වට්ටක්කා යොදා ගැනීමෙන් කිසිදු කෘතිම වර්ණක භාවිතයකින් තොරව ස්වභාවිකව ඉතා දැකුම්කළු වර්ණයක් මෙන්ම පෝෂණ ගුණයෙන් ද යුත් වට්ටක්කා අයිස්ක්‍රීම් ලබා ගත හැකිය.

මුළු බරෙන් 40% ක් වට්ටක්කා පල්පය භාවිතා කිරීමෙන් හෝ 20% වට්ටක්කා පිටි භාවිතයෙන් සකස් කළ හැකි නිෂ්පාදනයකි. වර්තමාන වෙළඳපොලෙහි බහුලව ඇති තරඟකාරී අයිස්ක්‍රීම් නිෂ්පාදන වලට වඩා වට්ටක්කා වල අඩංගු β කැරොටීන්, විටමින් සහ අනෙකුත් අත්‍යාවශ්‍ය ඛනිජ ලවණ මඟින් මෙම ඉහළ පෝෂණ ගුණය ලබා ගත හැකිවීම ද විශේෂත්වයකි.



විජලිත වට්ටක්කා



විජලිත වට්ටක්කා පිටි



වට්ටක්කා පල්පය

## වට්ටක්කා අයිස්ක්‍රීම් නිෂ්පාදනයට යොමු විය යුත්තේ ඇයි?

- වගා කන්නයේ දී වට්ටක්කා මිල ඉතා පහළයාම තුළින් ගොවීන් මුහුණපාන ගැටළු සහ අධික පසු අස්වනු හානියට පිළියමක් ලෙස ඉහළ පරිභෝගික රුචිකත්වයකින් හෙබි අයිස් ක්‍රීම් පෝෂණ ගුණයක් ද ඉහළ නැංවූ රසවත් අගය එක්කළ නිෂ්පාදනයක් වීම.

- වට්ටක්කා වල අඩංගු β කැරොටීන් ප්‍රතිඔක්සිකාරකයක් ලෙස ක්‍රියා කරන අතර සිරුරෙහි පිළිකා සෛල විනාශ කිරීමට හේතුවේ.

- වට්ටක්කා පල්පය ලෙස සහ වියළා පිටි ලෙස කල්තබා ගෙන පසු කාලීනව සකසාගත හැකි නිෂ්පාදනයක් ලෙස ද අයිස්ක්‍රීම් වෙළඳපොලට ඉදිරිපත් කළ හැකිවීම.

- වට්ටක්කා පල්පය හෝ පිටි සමඟ කිරි, සීනි, මේදය ආදිය එක්කර අයිස්ක්‍රීම් යන්ත්‍රය යොදා ගනිමින් නිපදවයි.

## අවශ්‍ය යන්ත්‍රෝපකරණ

- විජලන යන්ත්‍රය
- ඇඹරුම් යන්ත්‍රය
- අයිස්ක්‍රීම් සැකසීමේ යන්ත්‍රය
- කොලොයිඩ් මිල් (Colloid mill)



විජලන යන්ත්‍රය



අයිස්ක්‍රීම් සැකසීමේ යන්ත්‍රය